ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / Grade: 10 | විෂයය / Subject: සිංහල භාෂාව හා සාහිත්‍ය II | කාලය / Time: පැය 02 |

නම : ..............................................................................................

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
  **මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.**

1).I. සිංහල අක්ෂර මාලාවේ ඇති හ්‍රස්ව ස්වරයක් හා දීසර් ස්වරයක් ලියා දක්වන්න.

II. පහත සඳහන් වචනවල පිල්ලම් පිළිවෙළින් නම් කරන්න.

(අ) රූපියල

(ආ) මිදුල

III. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය.එම වචන දෙක පමණක් නිදොස් කොට ලියන්න.

(අ) විදුලි අබර්ුදය වතර්මානයේ අපේ රටේ ප්‍රභල ගැටලුවක් වී ඇත.

IV. පහත සඳහන් නිමර්ාණවල කතර්ෘවරු සඳහන් කරන්න.

(අ) මංතනන්නෝ

(ආ) අකීකරු පුත්‍රයෙකුගේ ලෝකය.

V. ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන් කරන්න.

(අ) යතුර

(ආ) මහල්ලෝ

VI. ඉරි ඇඳි පදවල ක්‍රියාපද වගීය ලියන්න.

(අ) <u>බල</u> සුබ නිමිති පෙර මග නැකතටත් වැඩි

(ආ) ගුරුතුමිය ශිෂ්‍යයා ලවා අකුරු <u>ලියවයි</u>.

VII. උපමානය උපමේය වෙන් කරන්න.

"වෙරළ දිගේ සැරසිල්ලක් මෙන් හරිත වණර් ශාකයෝ පෙනෙන්නට වූහ."

VIII. පහත සඳහන් රූඪී වල අදහස ලියන්න.

(අ) දෙහි කැපුවා -

(ආ) ලෑල්ලට පාගලා ගියා -

IX. පහත සඳහන් වාක්‍ය දෙක කමර් කාරකයට හරවා ලියන්න.

(අ) ගායකයෝ රසිකයන් සතුටට පත්කළහ.

(ආ) දරුවෝ දෙමව්පියන් නමදති.

X. පහත දැක්වෙන වාක්‍යයේ යුගල පද දෙක තෝරා ලියන්න.

(අ) වතුපිටි විනාශ කරමින් ගම් වැදුණු අලිරංචුව ගමේ නිවාස සුනු විසුනු කළහ .

2.) පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) විස්තර අතරින් ඒකක් තෝරාගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) රටක සැබෑ දියුණුවක් ඇති වීමට නම් එරට පුරවැසියන් බුද්ධිමත් අය විය යුතුය. ඒ අනුව අධ්‍යාපනය යනු රටක සංවර්ධනයට දායක වන ප්‍රබලතම සාධකයකි. දැනුම ලබාගැනීමම අධ්‍යාපනය සේ සැලකිය නොහැකි අතර, අධ්‍යාපනය යනු ජීවිතියට සෑම අතින්ම සූදානම් කිරීමය.රටක සංවර්ධනය උදෙසා අධ්‍යාපනයද බද්ධ විය යුතුය. ළමා පරපුරෙහි වගකීම විය යුත්තේ, නිදහස් අධ්‍යාපනයෙන් උපරිම ඵල ලබමින් හොඳින් ඉගෙනීමෙහි නිරත වෙමින් ,තමාටත් රටටත් වැඩදායී පුරවැසියන් වීමයි.

(ආ) නූතන ලොව බොහෝ රටවල තරුණ පරපුර ගිල ගන්නා රකුසෙක් ලෙස මත්ද්‍රව්‍ය හැඳින්වීම වරදක් නොවේ.විවිධාකාර නම් වලින් හැඳින්වෙන මෙම මත්ද්‍රව්‍ය බටහිර රටවල වේගයෙන් පැතිර යාමක් දක්නට ලැබේ.එහෙත් මේ වන විට ශ්‍රී ලංකාවේද තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් මත් රකුසාට බිලිවෙමින් සිටින බව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වල දිනපතා පළවන පුවත් සාක්ෂි දරයි. මෑතකදී කරන ලද පයෙර්ෂණ වලින් තහවුරු වී ඇත්තේ පාසල් සිසු දරුවන්ද , මේ විපතට ගොදුරු වී සිටින බවයි. මෙය කඩිනම් විසඳුම් සෙවිය යුතු කාගේත් අවධානය යොමු විය යුතු ගැටලුවකි.

(ඉ) රූපවාහිනිය නරඹන , පුවත්පත් බලන සැමගේ නෙත ගැටෙන ප්‍රධාන මාතෘකාවකි. රිය අනතුරු මහ මඟ පුරා දිනපතා දිවෙන විවිධ වගර්යේ රථ වාහන සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වීමත් සමග රිය අනතුරු ඉහළයෑමේ ප්‍රවණතාවයක් ද දක්නට හා අසන්නට ලැබේ. මේ සඳහා බලපාන ප්‍රධාන හේතුව ලෙස ,රියදුරන් හා පදිකයන්ගේ නොසැලකිල්ලත්, මහා මාගර් පද්ධතියේ අඩුපාඩුත් පෙන්වා දිය හැකිය . අහිංසක ජීවිත බිලි නොගන්නා අකාරයට දැඩි නීතිරීති මෙන්ම, සදාචාරාත්මක හැසිරීම්ද , රියදුරන්ගෙන් හා පදිකයන්ගෙන් ඉටුවිය යුතුය.

(ඊ) පාසල් සිසුන්ගේ නව නිපැයුම් පිළිබඳ ජනමාධ්‍ය වල නිතර අසන්නට හා දකින්නට ලැබේ . විවිධ වගර්යේ වාහන සෞඛ්‍යාරක්ෂිත උපකරණ ආදියද මේ අතර වේ. එහෙත් එම නව නිපැයුම් සමාජයට එක්වන්නේ ඉතා අල්ප වශයෙනි. ඊට හේතුව වශයෙන් ඔවුන් සඳහන් කරන්නේ , එම නිෂ්පාදන වෙළඳපොලට එක් කිරීමේ අපහසුතා පවතින බවයි.එබැවින් මෙම නව නිමර්ාණකරුවන්ට අතදී එම නිමර්ාණ රටේ සංවධර්නයට යොදා ගැනීමට අවස්ථාවක් උදාකර දීම කාලීන සමාජ අවශ්‍යතාවයකි.

(ලකුණු 25 )

3.) පහත දැක්වෙන ඡේදය වචන 50 – 60 අතර ගණනකින් යුක්ත වනසේ සාරාංශ කොට ලියන්න. ඔබගේ සාරාංශය අග වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

අධ්‍යාපනය යනු ළමයාගේ සිට වැඩිහිටියා දක්වා දැනුම, අත්දැකීම්, කුසලතා සහ නිවැරදි ආකල්ප අත්පත් කරගැනීමේ ක්‍රියාවලියකි. ළමයා පාසලෙන් මෙන් ම ජීවිතයෙන් ද ඉගෙනුම ලබයි. මිනිසා මුහුණදෙන ඇතැම් දේ ප්‍රීති ජනක අත්දැකීම්ය. තවත් අත්දැකීම් කනගාටුදායක අත්දැකීම් බවට පත්වේ. එසේ වුවද මේ දෙකම පදනම් කරගෙන ජීවිතයේ යම් යම් මුහුණුවර ඇසුරින් ඔහු ඉගෙනුමක් ලබයි. අධ්‍යාපනය මානවයා ශිෂ්ටසම්පන්න කිරීම සඳහා සංස්කෘතිය පවරා දී පරම්පරාවෙන් පරම්පරාවට තමන් ලැබූ දැනුම සම්ප්‍රදායන් ඊළඟ පරම්පරාවට කියා දීම සිදුකරයි. අධ්‍යාපනික, දේශපාලනික, සංස්කෘතික ,සහ සමාජීය වශයෙන් අධ්‍යාපනය ඇසුරු කරගෙන සමාජය වෙනසකට ලක්වන්නේ මේ නිසාය. අධ්‍යාපනයේ අරමුණ වන්නේ අඩුලුහුඩුවලින් තොර පරිපූණර් මිනිසෙකු බිහි කිරීමයි. පුද්ගලයෙකු තුළ පවතින පරිපූණර්ත්වය කුමක්ද යන්න ලෝකයේ බිහි වූ ශ්‍රේෂ්ඨ දාශර්නිකයන් විසින් ගෙනහැර දක්වා ඇත. සමාජයක් ලෙස සලකනුයේ පුද්ගල සමූහයක එකතුවකි. සමාජ සහයෝගීතාවය හා විනය ඇතිවන්නේ අධ්‍යාපනය තුළිනි .මේ අනුව සමාජය ඉදිරියට ගෙන යන මෙවලම අධ්‍යාපනයයි.

4.) ආදියෙහි කාව්‍ය හා ගීත අතර වෙනසක් නොවීය. මිනිසුන් කාව්‍ය රසවින්දේ ගීත රසය ද විඳිමිනි. මේ කලාවන් දෙක වැඩුණේ ද එකිනෙකින් අනෙක ප්‍රයෝජනය වෙමිනි. කවි තැනූ අය ඒවා ස්වර තාල ලය ආදියෙන් යුක්ත කොට ගැයිම සඳහා තැනූහ. රස විඳින අය අර්ථය පමණක් නොව ශබ්ද රසය ද සලකා රස විඳින්නාහුය.

කල් ගිය පසු ගීත කලාව කාව්‍යයෙන් ඈත් වන්නට වූ නමුත් දෙක අතර නෑකම දිවි ගියේ නැත.කාව්‍ය රසයෙන් ස්වර තාල ආදියෙන් ලැබෙන රස පෝෂණය කිරීමත්, ස්වර තාල ආදියෙන් කාව්‍ය රසය පෝෂණය කිරීමත් අද දක්වාම කෙරෙන්නෙකි. සිංහල කාව්‍ය රචනා කොට තිබෙන්නේ ගැයිම සඳහා ය.කාව්‍යයෙන් ලැබිය නොහැකි රසයක් ගීතයෙන් ලැබිය හැකි ය . ඒ ස්වර, තාල, ලය ආශ්‍රයෙනි. වචනවල ශක්‍යතාවය මත ඇති රස නිසා ගීතයෙන් ලැබිය නොහැකි රසයක් කාව්‍යයෙහි ද ඇත.නිහඬව කියවා රස විඳීමට පුරුදු වූයේ මුද්‍රණ යුගය උදා වීමෙන් පසුව ය.

i .මෙහි කියැවෙන කලාවන් දෙක කුමක් ද?

ii. කවි රස විඳි අය සැලකූ ප්‍රධාන අංශ දෙක මොනවා ද?

iii. ගීතයෙන් වඩාත් රසයක් ලැබෙන්නේ කුමක් සිදු වීම නිසා ද?

iv. ජීවිතයෙන් ලැබිය නොහැකි රසයක් හා කාව්‍යයෙන් ලැබෙන්නේ කුමක් පදනම් කරගෙන ද?

v. පහත සඳහන් පදවල අර්ථ ලියන්න.

(අ) ආදියෙහි

(ආ) ශක්‍යතාවය

5.) පවුල් 100 ක් පමණ ජීවත්වන ලංකාපුර සඳමල්ගම ප්‍රදේශයේ ජනතාවට දිගු කලක සිට පානීය ජල අබර්දයකට මුහුණ පෑමට සිදුව ඇත. ජල ටැංකි සකසා ජල නල යොදා ගනිමින් ව්‍යාපෘතිය ආරම්භ කර දැනට වසර තුනකට ආසන්න නමුත් ජල සැපයුම තවමත් ලබා දී නොමැත. පානීය අවශ්‍යතා මෙන්ම වෙනත් අවශ්‍යතා සඳහා ජලය නොමැතිකම පිළිබඳව ප්‍රදේශවාසීන් මහත් කනස්සල්ලට පත්ව ඇතිබැවින් හැකි ඉක්මනින් මෙම ගැටලුව විසඳා දෙන ලෙස ඉල්ලමින් ප්‍රදේශයේ ජල ප්‍රවාහන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ කළමනාකරු වෙත යවන ලිපිය සකස් කරන්න. සඳමල්ගම ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් සුගත් බණ්ඩාර ඔබ යැයි සිතන්න.

(ලකුණු 15 )

නැතහොත්

ඔබ පාසලේ වාෂිකව පැවැත්වෙන “ පොසොන් බැති ගී සරණිය” 2025 ජූනි මස 25 දින ප.ව. 5.00 සිට රාත්‍රී 9.00 දක්වා ගම්පහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමියගේ ප්‍රධානත්වයෙන් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වෙන බව දන්වා ආරාධිත අමුත්තන් වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

(ලකුණු 15 )